ජ්‍යෙෂ්ඨයන්ගේ සොඳුරු අඬහැරය

මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය
2025 ජනවාරි - 2025 ජුනි කලාපය

අංක: DOP/NEWS/34/2025 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදි.


# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමයේ ස්වර්ණ ජයන්ති උත්සවය



**ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමයේ ස්වර්ණ ජයන්තිය 2025 මාර්තු මස 15 දින රාජගිරිය විදු පියසේදී උත්කර්ෂවත් අන්දමින් පැවැත්වුණි.**

ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු කීර්තිමත් අධිපති වරයෙකු වූ ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මැතිතුමා ප්‍රධාන අමුත්තා ලෙසින් සහභාගී සහභාගී වූ මෙම උත්සවය ශ්‍රී ලංකා යුධ හමුදා සංස්කෘතික අංශය මගින් ඉදිරිපත් කළ රංගනයන් නිසාවෙන් ඒකාලෝක විය. අප සංගමයේ පූර්වගාමීන් හා මතක සුවඳ රඳවා අප අතරින් නික්ම ගිය සියළු සහෘදයන් සැමරීමත් සභාපතිවරුන් ලෙස සංගමය නිවැරදි දිශානතියට යොමුකළ හිටපු සභාපතිවරුන් වන විමල් රණසිංහ, ඔස්ටින් මිහිඳුකුලසූරිය, එම්.යූ.ඒ. තෙන්නකෝන්, ලක්ෂ්මන් ද සිල්වා, ආරියදාස තන්ත්‍රීගේ, ජයලාල් ජයවර්ධන මහත්වරුන්ගේ සේවය අගයා සමරු ඵලක පිළිගැන්වීමත් විශේෂයෙන් සිහිපත් කළ යුතුය. නොරටක සිටියද නිරතුරු මතකය සිය හිතවතුන් සමඟ බැව් දයාවෙන් යුතුව සිහිපත් කළ



ඩග්ලස් සිල්වා මහතා ජන ගී ගායනයෙන් සභාව කුල්මත් කළ අතර, විශේෂ මූල්‍ය පරිත්‍යාගයක් ද සංගමය වෙත ලබාදෙන ලදි. ආචාර්ය ඩබ්.ඒ. විජේවර්ධන මහතා හා ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා විසින් සාරගර්භ දේශනයන් පවත්වන ලද අතර මේසා දිගුකලක් විශ්‍රාමික සංගමය පවත්වාගෙන යාමම සාමාජිකත්වයේ කැපකිරීම් පිළිබඳ ජීවමාන සාධකයක් බැව් පැවසීය. සාමාජික සාමාජිකාවන් 300 කට නොඅඩු පිරිසක් මේ සඳහා සහභාගී වූ අතර, 1986 ජනවාරි 31 රුදුරු බෝම්බයෙන් දිවි අහිමි වූ සහෘදයන්ට පිං පැමිණවීමටත් අප විශ්‍රාමික සංගමයට 50 වසරක් පිරීමත් නිමිතිකොට රාජගිරිය රෝමානු කතෝලික දෙමළ මිශ්‍ර විද්‍යාලයේ අධ්‍යාපනය ලබන සිසු සිසුවියන් 50 ක පිරිසකට පාසල් පොත්පත් හා පාසල් උපකරණ බෙදාදීමක් සබැඳි වීඩියෝ දසුනක් ද ප්‍රදර්ශනය කෙරිනි. උත්සවය අතුරතුර ස්වර්ණ ජයන්තිය වෙනුවෙන් නිකුත් කළ සමරු කලාපයක් ද සාමාජිකයන් වෙත බෙදාහරින ලද අතර, තේ පැන් සංග්‍රහයකින් අනතුරුව උත්සවයේ සමාප්තිය සළකුණු කෙරිනි.



**සටහන : ජගත් කාරියවසම්**

**P/1215**

# 2025 දී 75 ක් හා 50 ක්

✶ 'මුදල් ඇත්නම් දෙවියොත් නැමෙති.මුදල් නැති විට මිනිසෙක්වත් නොනැමෙයි'. (චීන)
✶ 'මුදල් හිඟ මිනිසා මාර්කෙට්ටුවෙන් ඉක්මනින්ම පිට වෙනවා'. (ප්‍රංශ)
✶ මුදල් නැතිව සනීපෙන් ඔහේ සිටීම භාගයක් ලෙඩින් සිටීමකි (ඉතාලිය)

## 75 ට පිවිසීම

සාඩම්බර ලෙස ශතවර්ෂ තුන්කාලක් හෙවත් අවුරුදු 75 ක් වයස් සපුරන්නී අපගේ මූල්‍ය මෑණියෝය. දුර දක්නා නුවණින් හා ගැඹුරු සාක්ෂරතාවයෙන් පෝෂිතව මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙය වූ ඇය දේශයේ ශක්තිමත් පෙර ගමන්කාරිය වන්නීය. ඇය එසේ පෙර ගමන්කාරිය වූයේ ජන්මයත් සමගම ඇයට දායාද ලෙස උරුම කළ පූර්ණ ස්වාධීනත්වය නිසාය. ඒ නිසා ශ්‍රී ලාංකීය රුපියල ස්ථායිව, සුරක්ෂිතව හා ශක්තිමත්ව හැසිරෙන්නට වූ බව රහසක් නොවේ.

දුර අතීතයේදී පැවති ප්‍රාථමික භාණ්ඩ හා සේවා හුවමාරු ක්‍රමය වෙනුවට කාසි හෙවත් මුදල් භාවිතයට ලංකාව ක්‍රමානුකූලව පරිවර්තනය වන්නේ විදේශීය ආක්‍රමණයන්ගෙන් පසුවයි. එබඳු ප්‍රාථමික සමාජ භාවිතාවන් වශයෙන් කහවනුව (කහපණ), මස්ස, දොයිතුව ආදිය කාසි ලෙස තිබුණ බව කියැවේ. එසේම ටැංගෝ මස්ස හා කොකු කාසිය වශයෙන් තවත් කාසි වර්ග දෙකක් භාවිතාවේ පැවති බව ඉංග්‍රීසි ජාතික **රොබට් නොක්ස්** සිය වාර්තාවේ සඳහන් කරයි.

ඉන්පසුව ඉංග්‍රීසි හෙවත් බ්‍රිතාන්‍ය පාලන සමයේදී පැන්ස, සිලිම්, පවුම් භාවිතය ඇරඹේ. වර්ෂ 1884 සිට දියත් වන්නට පටන්ගත් මෙම හුවමාරු භාවිතාව ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමය වශයෙන් ආර්ථික හා මූල්‍ය ඉතිහාසයේ දැක්වේ. එම **ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමය** වර්ෂ 1950 දක්වා ක්‍රියාත්මක විය. ඒ අතරතුර වානිජවාදය බිහිවීමේ ප්‍රසව ලකුණු පහළ වෙමින් තිබිණ. පවතින භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ හා හුවමාරුවේ ගුණාත්මක පරිවර්තනයක් ද අවශ්‍ය වෙමින් තිබිණ. එම අවශ්‍යතාවය සපුරමින් වෙළඳපොළ සමඟ මුදල් ආර්ථිකය ඇති විය. ඒ වනතුරු ශ්‍රී ලංකා සමාජ දේහය තුළ දකින්නට තිබුණු ගමන් රටාව හඳුනා ගැනීමේදී එය මන්දගාමීද? පසුගාමීද? එතැන් ගාමීද? නැතහොත් විතැන්ගාමීදැයි හඳුනා ගැනීම දුෂ්කර වූ කාර්යයකි.

## රුපියල

කෙසේ නමුත් ලාංකීය සමාජයේ පැවැත්ම නූතනවාදී හැඩයකට යොමු කරමින් 'පෙරටුගාමී' පියවර එසවීමක් විය. එය වනාහි එවකට වඩාත් විද්‍යාත්මක වූද සාධනීය වූද ශාස්ත්‍රීය වූද ශක්තිමත් වූද පවිත්‍ර වූද ස්වාධීන මූල්‍ය අධිකාරිය පිහිටුවීමයි. එයට බාහිර බලපෑම් වලින් හා මැදිහත්වීම් වලින් මිදුනු පූර්ණ ස්වාධීන ආයතනයක් වශයෙන් උප්පැන්න සහතිකය නිකුත් කිරීම ද සිදු විය. එමෙන්ම එය සුවිශේෂයක් ද විය.

එම නිර්මල උපත සිදුවන්නේ 1950 අගෝස්තු 28 වෙනිදාය. එදින සඳුදා දිනයක් විය. අප ශ්‍රී ලංකා මහ බැංකුව – Central Bank of Ceylon නමින් බෞතිස්ම වූවාය. එතැන් පටන් විධිමත්ව මූල්‍ය ප්‍රතිපත්තිය හැඩගැන්වෙමින් ශක්තිමත් වූවාය.

මුලින්ම කුලී පදනමක් මත කාර්යාලීය පහසුකම් ලබාගත් සයිමිස් ගොඩනැගිල්ලෙන් ශ්‍රී ලංකා මහ බැංකු කටයුතු දියත් කෙරිණි. එදා සිටම මූල්‍ය අධිකාරී බලය පාරම්පරික උරුමයක් විය. නෛතික වශයෙන් එම මූල්‍ය අධිකාරීත්වය මහ බැංකුව වෙත ආරෝපිත වී ඇත්තේ 1950 අංක 49 දරණ මුදල් නීති පනතට අනුවය. එහි පෙරමඟ දක්වමින් විහිදුවන්නට වූ විද්‍යාත්මක නූතනවාදී ආලෝක ධාරාව මගින් රුපියල කළ එළිවන්නට විය. කෙසේ නමුත් මුදල් යනු ගිවිසුමකට අනුව අප එකඟ වූ දෙයයි.

## මූල්‍ය කාර්යභාර

එදා මෙදාතුර 'ශ්‍රී ලංකා මහ බැංකුව' සිය මූල්‍ය ප්‍රතිපත්තිය විමර්ශනාත්මකව හා ස්වාධීනව පවත්වාගෙන යන්නේය. කළයුතු කාර්යයන් කළයුතු ඇසිල්ලේම දියත් කරමින්

3 පිටුවට...

රුපියලේ ස්ථායීතාවය සුරකී. භාණ්ඩ හා සේවාවන්ගේ මිල මට්ටම් විධිමත්ව හා ශක්තිමත්ව පවත්වාගෙන යයි. මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව රකියි. බැංකුකරුවන්ගේ බැංකුව ලෙසින් ක්‍රියා කරයි. ජාත්‍යන්තර මූල්‍ය ආයතන සම්බන්ධීකරණය කරයි. එමෙන්ම පවත්නා රජයේ 'රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය' උදෙසා අවශ්‍ය මූල්‍ය සම්පත් සැපයීම ආදී මූලික කාර්යයන් සඳහා අවශ්‍ය අධිකාරී බලය ද ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ.

සමාජ විද්‍යාත්මක පැහැදිලි කිරීමට අනුව බලය දෙවැදෑරුම් වේ. ඒ ආරෝපිත (Attributed) හා සාධිත (Nurture) බලය වශයෙනි. ඉන් ආරෝපිත බලය යනු ජන්ම දායාදයක් වශයෙන් උරුමවන බලයයි. සාධිත බලය ලෙස දැක්වෙන්නේ යම් යම් හැසිරීම් හා ක්‍රියාකාරීත්වයන් මගින් ගොඩනගා ගන්නා බලයයි.

වර්ෂ 1950 සිට ලාංකීය ජන සමාජයේ මූලික ආර්ථික අවශ්‍යතාවන් ශක්ති පමණින් - ඥාණ පමණින් වඩාත් යහපත් ලෙසින් මෙහෙයවීම සඳහා වූ අධිකාරී බලයක් ආරෝපිත වූ ආයතනයක් මෙන්ම ඊටම ආවේනික ප්‍රතිපත්ති ගොන්නක් ද '**ශ්‍රී ලංකා මහ බැංකුව**' සතු වේ. එය වනාහි අන් කිසිවක් නොව '**මූල්‍ය ප්‍රතිපත්තියයි**'.

## මූල්‍ය ප්‍රතිපත්තිය

ඕනෑම දේශයක මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම සිදු කරන්නේ එම දේශයේ මූල්‍ය අධිකාරිය හෙවත් මධ්‍යම බැංකුව විසිනි. එබඳු ප්‍රකට මහ බැංකු කිහිපයක් මෙසේ පෙළ ගැස්විය හැකියි.

- ඇමෙරිකානු සංචිත බැංකුව (Federal Reserve Bank)
- ජපන් මහ බැංකුව (Bank Of Japan)
- ජර්මන් මහ බැංකුව (Bunders Bank)
- යුරෝපීය මහ බැංකුව (Europian Central Bank)
- ඉන්දියානු මහ බැංකුව (Reserve Bank Of India)
- පකිස්ථාන් රාජ්‍ය බැංකුව (State Bank Of Pakistan)
- කැනේඩියානු මහ බැංකුව (Bank Of Canada)

## කාර්යයන්

උක්ත මහ බැංකු විසින් ඉටු කරනු ලබන අසමාන කාර්ය භාරය ඉතාමත් සංක්ෂිප්තව දක්වන්නේ නම් මුදල් සැපයුම පරිපාලනය, රජයේ බැංකුකරු මෙන් ක්‍රියා කිරීම, විනිමය අනුපාතය සුරැකීම, මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය පවත්වාගෙන යාම, ජාත්‍යන්තර මූල්‍ය ජාලය සමඟ කටයුතු කිරීම වැනි භාරදූර කාර්යයන් රාශියකි. වර්ෂ 1950 සිට මේ දක්වා 75 වසරක් ශ්‍රී ලංකා දේශය සුවපත් වූයේ උක්ත ව්‍යායාමයන්හි විධිමත්ව නියැලුන නිසාය. ශ්‍රී ලංකාව තුළ එම ගෞරවයට නොමඳව උරුමකම් කියන්නේ අපගේ ශ්‍රී ලංකා මහ බැංකුව යි. වසර 75 ක ජන්ම සංවත්සරය සැමරීමට ආසන්න වෙමින් සිටින්නේ එම උත්තුංග උත්තරීතර ආයතනයයි. **එම අසමසම තුරු සෙවණට විශ්‍රාමිකයන් වන අපි ශීර්ෂ ප්‍රණාමය කරමු.**

## නියමුවෝ හා කැපවූවෝ

**ශ්‍රීමත් ජෝන් එක්ස්ටර්** ප්‍රථම නියමුවාණෝය. ඔහුගේ තීක්ෂණ මූල්‍ය හා ආර්ථික ප්‍රතිපත්තීන් සක්‍රීය ලෙස ක්‍රියාත්මක කිරීම උදෙසා සහකාර වූ කාර්ය මණ්ඩලයක් ද වූ බව සඳහන් වේ. එතැන් පටන් එම සියළුම කාර්යයන් ශාස්ත්‍රීයව, නිරවුල්ව, විද්‍යාත්මකව, ඇපවීමෙන් හා කැපවීමෙන් ක්‍රියාත්මක කරනු ලැබුවේ උගත් බුද්ධිමත් පරිණත අධිපතිවරුන්, නියෝජ්‍ය අධිපතිවරුන්, සහකාර අධිපතිවරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු (එවකට සිටි) අනෙකුත් කාර්ය මණ්ඩලයේ අමිල දායකත්වයෙනි. තව නොබෝ දිනකින් වසර 75 ක් සපිරීමට ආසන්නවෙමින් පවතින්නේ උක්ත සේවා දායකත්වයෙන් පරිණත වෙමින් පෙරටුගාමී වූ ආයතනයයි.

## කල්පිරීම ඇරඹේ

කාර්ය ශූරත්වයෙන් හපන් පුද්ගලයාටත්, පුරුදු පුහුණු කරන ලද ශාස්ත්‍ර විද්‍යා ශිල්ප ප්‍රගුණ කළ පුද්ගලයාටත්, රාජ්‍ය සේවයෙහි කෘතහස්තතාවක් සහිත පුද්ගලයාටත්, කළයුතු

4 පිටුවට...

නොකළ යුතු දෙය විචාර බුද්ධියෙන් විමසා ක්‍රියා කරන පුද්ගලයාටත් සේවාවෙන් කල් පිරෙන දිනයක් උදාවන්නේමය. එම දිනය එන්නේමය. එය භාරගත යුත්තේමය.

නිකුත් වී තිබෙන සංඛ්‍යා ලේඛන අනුව අද අප ජීවත්වන්නේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සංඛ්‍යාව බහුල වෙමින් පවතින සමාජයකය.

ආයතනය හිරුට සඳුට අවනතව පරිණත වෙද්දී, මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමට පූර්ණ කාලීනව ඇප කැප වූ කාර්ය මණ්ඩලය ද (කල්පිරෙන දින වකවානු අනුව) පරිණත වී විශ්‍රාම ගැන්වීම සිදුවන්නට පටන් ගත්තේය. එසේම එම පුරප්පාඩු නව පරපුරෙන් පිරවීමට ද ආයතන සංග්‍රහය වහාම කටයුතු කරයි. ඒ අතරතුර කල්පිරීමෙන් පමණක් නොව ස්වෙච්ඡාවෙන් ද විශ්‍රාම යති. ඒ සියල්ලෝම විශ්‍රාමිකයෝය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවාවෙන් නිසි ලෙස කල්පිරීමෙන් පසු ප්‍රථමයෙන්ම, මුලින්ම හා පුරා කියා විශ්‍රාම යාම ඇරඹෙන්නේ වර්ෂ 1975 දීය.

එසේ මුලින්ම මහ බැංකු සේවාවෙන් විශ්‍රාමය ලැබූ කාර්යශූර සේවක පිරිසෙන් බහුතරයක් මේ වන විට දිවි ගිමන පියවා හමාරය. තවත් වැඩි දෙනෙක් බෙහෙත් හා සාත්තුවේ සුව විඳිති. එසේම ඒ පොකුරේ සදාදරණීය පිරිසක් ද ශේෂව සිටිති.

ඔවුහු දයාබර, කුළුණුබර, සෙනෙහෙබර 'මහ බැංකු' මෑණියන් වහන්සේ දෙස නෙත් අයා බලා සිටිමින් අතීත මතක සුවඳ ද විඳිමින් පසුවෙති. යථොක්ත මානව සම්පතේ හර හා බැර ගිණුමේ ශේෂය මගින් අප කාටත් පෙන්වා දෙන්නේ සොඳුරු අතීතයයි.

## අතීතයේදී

සෑම පුද්ගලයෙකුට වගේම ඕනෑම ආයතනයකටත් අතීතයක් ඇත. එම අතීතය සොඳුරු මෙන්ම අඳුරුද විය හැකිය. එම අඳුරු - සොඳුරු දෙකෙන්ම අනාගතයට පාඩමක් උගත හැකිය. ඒ අනුව අතීතය දිසාපාමොක්වරයෙකි. මානව හර පද්ධතීන් අප හැමටම උරුම කර දෙන්නේ අතීතය නැමැති දිසාපාමොක් පරපුරෙනි.

දශක පහමාරක් ස්වාධීනව නිර්මලව මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවමින් රුපියලේ ක්‍රය ශක්තිය (ක්‍රියා ශක්තිය නොවේ.) රැක ගත්තේය. උද්ධමනය ක්‍රමානුකූලව පැවතියේය. මුදල් විශුද්ධිකරණයක් අවශ්‍ය නොවිය. සිදුකළේ රුපියල් පනහ සහ සියයේ පැරණි නෝට්ටු අවලංගු කර අළුත් රු 50 සහ රු 100 නෝට්ටු නිකුත් කිරීමයි. එමගින් උද්ධමනය හා මූල්‍ය පාලනය විධිමත්ව මෙහෙය වීමයි. එබඳු විධිමත් මූල්‍ය පාලනයක් පිළිබඳව තතු වාර්ෂික වාර්තා පනහකින් පමණ පැහැදිලිව වාර්තා කර තිබේ.

එසේ නිරවුල්, ආර්ථික විද්‍යාත්මකව දේශයේ ආර්ථික දේහය පෝෂණය කරමින් ප්‍රතිකාර කළ වෙදැදුරන් කෘතහස්ථ අධිපතිවරුන් කාලනිර්ණය අනුව මෙසේ පෙළගැස්විය හැකිය.

| | | |
|---|---|---|
| 1) | ශ්‍රීමත් ජෝන් එක්ස්ටර් | (1950 සිට 1953 දක්වා) |
| 2) | එන්. යූ. ජයවර්ධන මහතා | (1953 සිට 1954 දක්වා) |
| 3) | ඒ. ජී. රණසිංහ මහතා | (1954 සිට 1959 දක්වා) |
| 4) | ඩී.ඩබ්. රාජපතිරණ මහතා | (1959 සිට 1967 දක්වා) |
| 5) | ඩබ්. තෙන්නකෝන් මහතා | (1967 සිට 1971 දක්වා) |
| 6) | එච්.ඊ. තෙන්නකෝන් මහතා | (1971 සිට 1979 දක්වා) |
| 7) | ඩබ්. රාසපුත්‍ර මහතා | (1979 සිට 1988 දක්වා) |
| 8) | එච්. එන්. එස්. කරුණාතිලක මහතා | (1988 සිට 1992 දක්වා) |
| 9) | එච්.බී. දිසානායක මහතා | (1992 සිට 1995 දක්වා) |
| 10) | ඒ.එස්. ජයවර්ධන මහතා | (1995 සිට 2004 දක්වා) |
| 11) | සුනිල් මෙන්ඩිස් මහතා | (2004 සිට 2005 දක්වා) |
| 12) | අජිත් නිවාඩ් කබ්රාල් මහතා | (2006 සිට 2015 දක්වා) |
| 13) | අර්ජුන මහේන්ද්‍රන් මහතා | (2015 සිට 2016 දක්වා) |
| 14) | ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා | (2016 සිට 2019 දක්වා) |
| 15) | මහාචාර්ය ඩබ්.ඩී. ලක්ෂ්මන් මහතා | (2019 සිට 2021 දක්වා) |
| 16) | අජිත් නිවාඩ් කබ්රාල් මහතා | (2021 සිට 2022 දක්වා) |
| 17) | ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා | (2022 සිට මේ දක්වා) |

5 පිටුවට...

## අඳුරු පැල්ලම්

නිර්මලව සාදු සිතින් ආරම්භ කොට දියත් වූ ශ්‍රී ලංකා මහ බැංකුව දශක හතහමාරක ගමනක් පැමිණ ඇත. ඉන් මුලින්ම දැක්විය හැකි දශක හයමාරක වකවානුවේ ගමන් රටාව නිර්මලය. පිවිතුරුය. දීප්තිමත්ය. එමෙන්ම රුපියල නිරෝගීව ශක්ති සම්පන්න වූ බව සතුටින් කිව හැකිය. එසේ වුවද අඳුරු, නුහුරු, දුගඳ කළු පැල්ලම් හට ගැනීමක් (දශකයක් පමණ වත්මනට ඈතින්) සිදු වූ බව දැනෙන්නට විය. එවැන්නක් ඇති කරන්නේ මෙතෙක් පැවති විද්‍යාත්මක, නිර්මල, ශාස්ත්‍රීය වූ මූල්‍ය පාලන අධිකාරිය සඳහා අවිද්‍යාත්මක අදූරදර්ශී පිරමීඩාකාර දේශපාලනික, ඥාතිසංග්‍රහාත්මක ඉහළම පත් කිරීමක් නිසාවෙනි.

එම අදූරදර්ශී පත් කිරීම් හා අතපෙවීම් නිසා භාණ්ඩ හා සේවාවන්ගේ මිල මට්ටම් අයාලේ යන්නට විය. හිතුවක්කාරීව මූල්‍ය පාලනය ලිහිල් වී, මුදල් සංසරණය වැඩි වී, උද්ධමනය කුළු හරකෙක් බඳු විය. දේශීය හා විදේශීය ණය පොට්ටනිය නිරතුරුවම පුළුල් වන්නේය. ඒ සමඟම ගෙවුම් ශේෂයද ඉදිමෙන්නට විය. උද්ධමනීය කුළු හරකා පැන පැන අනිමින් සිටී.

නොසිතූ ලෙස හටගත් මෙම ආර්ථික රෝග ලක්ෂණ විමර්ෂණය කරමින්, ජාත්‍යන්තර මූල්‍ය වර්ගීකරණ හා විගණන ආයතන විසින් අප රට අසමත් රාජ්‍යයක් හා බංකොළොත් රාජ්‍යයක් වශයෙන් නම් කරන ලදී. කිසියම් දුර්බුද්ධිමත් පුරුෂයෙක් අනාගත විපාකය නොසලකා ක්‍රියා කළහොත් හෙතෙම අවමානයක් මෙන්ම විනාශයක්ද ලබන්නේම යැයි ද විෂ්ණු ශර්මන් පඬිවරයා ද පෙන්වා දී තිබේ.

කෙසේ නමුත් අදට සමීප වසර දෙක තුන තුළ දේශීය ආර්ථිකය හා රුපියල ශක්තිමත් වී බංකොලොත් බවින් මිදී ඇති බව වාර්තා විය. එය වත්මන් අධිපතිතුමන් ඇතුළු විදග්ධ කාර්ය මණ්ඩලයේ ශාස්ත්‍රීය දැනුම හා පූර්ණ කැපවීම නිසාම විය යුතුය. ඔබ සැමදෙනාම ද විශ්‍රාමය උදාවනතුරු ඔය කැපවීම ඔහොමම ගෙන යන්න. 75 වෙනි සංවත්සරය වාසනාවක්ම වේවා !!!

**අමරපාල කරසිංහ ආරච්චි**

## මා සුමිතුරා



ඔත්පල වූ දා පටන් ම
මා හා රැඳි මගෙ සුමිතුර
ගිනි අව්වෙත් මහ වැස්සෙත්
සෙවනැල්ලක් විලස රැඳුන

රැයක් දවාලක් නොතකා
කිසි මැසිවිල්ලක් නොනගා
අත්වැල වී ජීවිතයට
මා හා සිටි මගෙ සුමිතුර !

නුඹ සක විලසට කැරකෙන
ජීවිතයේ දුක සැප අස
මා සේ මගේ සුතනඹුවන්
රැකගනු මැන මා සුමිතුර

මහ බැංකු බෝම්බ ප්‍රහාරයෙන් ආබාධිත වූ මා හට ලැබූ වන්දි මුදලින් ඉදිරියේ රැකියාවට පැමිණීම සඳහා එකල අතිරේක මුදලක් ද වැය කොට මිලදී ගත් තුන්රෝද රියේ ඡායාරූපයක් සමඟින් කවි පංතිය ඉදිරිපත් කරමි.

**ඩබ්.ඒ. ශාන්ත**
**P/1676**

# අභියෝග ජයගැනීම

තුරුලතාවන්ගෙන් පිරුණු, සුරතල් සතුන්ගේ, මිහිරි නාදයන්, ඇසෙන සුන්දර ගම්මානයක ඉපදුනු, පියදාස හා ගුණසේන යන දෙදෙනා ඉතාම කුළුපග යාළුවෝ දෙදෙනෙකි. ඔවුන් ස්වභාව ධර්මයට ගරු කරන කෙළිලොල් තරුණයෝ දෙදෙනෙකි.

පියදාසගේ පියා ඒ තරුණ පුතුට ගුණ දහම් වලට වඩා කියා දුන්නේ මුදල් මත හඹා යාමට ය. එහෙත් ගුණසේනගේ පියා ''කියාදුන්නේ සාරධර්මයන්ගෙන් පිරුණු යහ ගුණය. සොබාවධර්මයට ගරුකර ජීවත් වන ලෙසටය.

පියදාසගේ පියා පොල් මුදලාලි කෙනෙකි. ගුණසේනගේ පියා ප්‍රාදේශීය සභාවේ කුණු ලොරියේ යන කෙනෙකි. කෙසේ වෙතත් කාලයාගේ ඇවෑමෙන් මේ පුතුන් දෙදෙනාගේ ඉගෙනීමේ කටයුතු වලදී ඉරණම් වෙනස් විය. පියදාසගේ පුතා පොහොසත් දරුවෙක් වුවද, ඔහුට සියළු සම්පත් තිබුණත් ඉගෙනීමේ කටයුතු වලදී මැලිකම් දක්වයි. එහෙත් කුණු ලොරියේ තාත්තා වැඩ කළත් පුතා හොඳට ඉගෙනීම කරයි. පියදාසගේ පුතා නගරයේ පාසලකට ගියේය. එහෙත් ඔහුට සාමාන්‍ය පෙළ අසමත් නිසා උසස් පෙළ කළ නොහැකි විය. ගුණසේනගේ පුතා විභාගය සමත් විය.

පියදාසගේ පුතා 'සහන්' විය. ගුණසේනගේ පුතා 'ප්‍රියාන්' විය. ප්‍රියාන් දුකසේ ඉගෙන ගත්තත් ඔහුට වෛද්‍යවරයෙකු වීමට තරම් සුදුසුකම් උසස් පෙළ විභාගයේදී ලකුණු ලැබුණේය.

මේ ගැන දැනගත් පියදාස මුදලාලි ගුණසේනගේ නිවසට පැමිණියේ ය. ආ.... මහත්තයා, කියමින් ගුණසේන එළියට ආවේය. උඹගේ පුතා හොඳට විභාගය සමත් කියලා දැනගන්න ලැබුණා කීවේය. 'ඔව් මහත්තයා' හොඳට විභාගය පාස්. එත් ඉතින් අපට ලොකුවට උගන්වන්න, සල්ලි නෑනේ. පුතාට නම් දොස්තර කෙනෙක් වෙන්න ඉගෙනගන්න ඕනලු.

''පිස්සුද බං'' උඹලගේ තරමට වැඩ කරපල්ලා. උඹගේ රස්සාවට එක්කගෙන පලයං බං, කීයක් හරි හම්බකරගන්න පුළුවන්නේ, නැති බැරි මිනිස්සු කීවේය. වෛරයෙන් පිරුණු මේ මිනිසාගේ කථාව ගැන, ගුණසේනට හරිම හිත රිදීමක් විය. ඔව් මහත්තයෝ, අපේ කොළුවා මොනවා කියයිද දන්නේ නෑ. හ්ම් හ්ම් කීවේ. තමන්ගේ පුතාට මුදල් තිබිලත් අපගේ කොළුවාට ඉගෙන ගන්න බැරි වුණානේ කියා පියදාස කම්පා වී කෝපවිෂ්ට විය. ප්‍රියාන් කෙසේ හෝ දුක් ගැහැට මැද ඉගෙනගෙන වෛද්‍යවරයෙකු විය. නගරයේ රෝහලකට පත්වීම ලැබුණි. මෙය දැනගත් පියදාසට නිතර නිතර පපුවේ වේදනාවක් ඇතිවුනි. දිනක් අසනීපය තද වී රෝහලට තම බිරිඳත්, පුතාත් සමඟ පියා සුව සැරියකින් රෝහලට රැගෙන යන ලදි.

හදිසියේම පියදාසට හෘද වස්තුවේ සැත්කමක් කිරීමට සිදුවිය. එම අවස්ථාවේ පියදාසගේ බිරිඳ මිසී කෙනෙක් ගෙන් ප්‍රියාන් දොස්තර ගැන ඇසුවේය. ආ... දොස්තර මහතා දැන් තියටර් එකේ. මං එළියට ආවම කියන්නම්, ඔයාගේ නම කියන්නකෝ කීවේය.

පැයක පමණ කාලයක් තුළදී සැත්කම අවසන් විය. මේ ශෛල්‍යකර්මය කර තිබුණේද ප්‍රියාන් දොස්තර මහතා විසින් බව පියදාසගේ බිරිඳත් පුතාත් දැනගත් අතර ප්‍රියාන්ට කළ මදි පුංචිකම පිළිබඳව ඔවුන්ට දැඩි ලැජ්ජාවක්ද ඇතිවිය.

අනුන්ට වල කපන අයට ස්වභාව ධර්මය විසින් ඔවුන්ට කැපෙන වල ගැඹුරු බව පෙනේ. මිනිස් ස්වභාවයටම මෙයින් හොඳ පාඩමක් කියාදෙනු ඇත. නැවත කථාවකින් හමුවෙමු.

**ආරියවතී මුතුකුමාරණ**
**W&OP 842**

# කලින්ම ඇයි?

හෙටක් හදන ලෙස බරක් කරට ගෙන
　　　　තිබුණත් උහුලන දිරිය　　　　හිතක්
දිනක් ගෙවන විට එක වේලක් හරි
　　　　තිබ්ලද කුසකට දැනෙන　　　　බතක්
ඉමක් දකින මෙන් නිමක් නොමැති දුක්
　　　　සඟවාගෙන පා සොඳුරු　　　　වතක්
සැපක් විඳින ලෙස රටින් පිටට ගොස්
　　　　තැබුණේ නොමැකෙන අඳුරු　　　　තිතක්

දක්නට ලැබුණේ සවනත රැඳුනේ
　　　　රුදුරු අමනකම් ගහන　　　　ලොවක්
සක්විති වූවත් සිත් තොස් නැත්නම්
　　　　ඒකත් පෙර සිට ගෙනෙන　　　　පවක්
ඉක්මන් තීරණ ගන්නට සිතුනේ
　　　　දැනිලද ඉදිරිය පෙනෙන　　　　ඉවක්
දුක් කෙනෙහිලිකම් කොච්චර ආවත්
　　　　නැහැ නූලෙන් පිට රැඳුන　　　　බවක්

මිහිරක් ඇතිකොට පෙණ කැටි විසි කොට
　　　　මිණිකැට මතු කොට ගලන　　　　ගඟක්
සයුරක් අබියස ගොළුවනු නියතයි
　　　　තුරුණු හපන්කම් අතැර　　　　හුඟක්
සතුටක් විඳිනට කවුරුත් තුටු කොට
　　　　පෙන්නා අවිහිංසකම　　　　දඟක්
කිසිවක් නොකියම ඔබ කල් ඇතිවම
　　　　නිදි යහනක ඇයි? නැතිව　　　　වගක්

**ඒ.එච්. පේමදාස**
**077-3410528 / 011-2928944**



ටීචර් : ළමයි, අද පාඩම ආදිවාසීන් ගැන... ඉස්සර ඔවුන්ගේ ඇඳුම් වුණේ ගස්වල කොළ අතු... කොළ අතු තමයි හැම තැනටම ඔවුන් ඇඳන් ගියේ...



සුනිමල් :
එතකොට ටීචර් ඒ වැද්දාගේ පස්සෙන් හරකෙක් ඇවිත් කොළ අතු ටික කෑවොත්...?



ගර්ර්ර්

## රෝගියා



දැන් මට කියනවකෝ මම උදේ 9 ට බොන්න කියපු ඇන්ටිබයොටික් එක උදේ 6 ට බිව්වේ ඇයි කියලා



හදිසි ප්‍රහාරයක් දීලා බැක්ටීරියා ටිකක් පුදුම කරවලා කොර කරලා ගන්න හැදුවේ ඩොක්ට



උගේ අප්පගෙ ලෙඩෙක්නෙ බං මූ

**මුහුණු පොතින්...**

# අයිස් ක්‍රීම් කෑම



මංගල සාදයකට සහභාගී වූ සයිමන් අයිස් ක්‍රීම් බෙදන තැනැත්තා වෙත ගොස් අයිස් ක්‍රීම් එකක් ගෙන තම බිරිඳ සිටින ස්ථානයට ගොස් එය කන්නට පටන් ගත්තේය. මෙය පස් පාරක් කළේය මෙයට සයිමන්ගේ බිරිඳට කේන්ති ගොස් සයිමන්ට බැන වැදුනේය.

**බිරිඳ :** තමුසේට ඇත්තටම ලැජ්ජාවක් නැද්ද? දැන් කීපාරක් අයිස් ක්‍රීම් කෑවද?

**සයිමන් :** මොකට ලැජ්ජා වෙනවද මම ගේන්නෙ ඔයාට කියලනේ බබා...

**මුහුණු පොතින්...**

# "චිරං ජයතු - ලොකු අයියේ"



මහ බැංකුව පිහිටෙව්වේ 1950 අගෝස්තු 28 දා ඒ කියන්නේ 2025 අගෝස්තු 28 දාට අවුරුදු 75 ක් වෙනවා. එම 75 වන සංවත්සරය පිළිබඳව සටහන් කෙරුණු පුවරුවක් මේ දවස්වල මහ බැංකු ප්‍රධාන ගොඩනැගිල්ල ඉදිරිපිට සවිකර තිබෙනවා.

අපේ මහ බැංකු විශ්‍රාමික සංගමයේ සාමාජිකයන් අතරින් වැඩිමලා කවුද? ඒ ආර්.බී. සේනාරත්න කියලා මහත්මයෙක්. ඔබට මතකද එතුමාව ඔහු විශ්‍රාම ගිහිං තියෙන්නේ 1984 වසරේදියි. ඊට පෙර සේවයේදී හිටපු හැමෝම මේ මහත්තයව හොඳට දන්නවා. ඔහු 'රෙඩ්ලිච් සේනාරත්නයි'. 'රෙඩ්ලිච්' කිව්වාම ගොඩ දෙනෙක් දන්නවා. මා ඔහු සමඟ කිසිදිනක එකම දෙපාර්තමේන්තුවක සේවය නොකලත් ඔහු හැමෝම සමඟ සුහදව සිටි කෙනෙක් ලෙසයි. මගේ මතකයේ තියෙන්නේ. උදෑසන මහ බැංකුවේ කොරිඩෝ හරහා යන විට අත ඔසවා වනමින් සිනාමුසු මුහුණින් තම සගයන්ට "Good Morning" කියමින් සුභ පැතූ හැටි මට මතකයි. වරක් මා විශ්‍රාම වැටුප් අංශයේ සේවය කරන අවස්ථාවේදී ඔහු මා වෙත පැමිණියා. ඒ වන විට ඔහුව හඳුනන කිසිවෙකුත් අවට නොසිටියත් ''ආ කොහොමද මිස්ට සේනාරත්න? එන්න එන්න ඉඳගන්න. මොකද මේ පැත්තේ?'' කියලා මම කථා කළාම ''ඔයා මාව දන්නවද?'' කියලා සිනා පිරි මුවින් අහපු හැටි මට මතකයි. මම කිව්වා'' මොකද දන්නේ නැත්තේ මට මතකයි ඉස්සර චන්ඩියෙක් වගේ අත පය විසි කර කර යාළුවො එක්ක විහිළු කර කර කථා කර හිටපු විදිය'' එවිට ඔහු අහිංසකව සිනාසුනා. නාඳුනන පිරිස මැද මා ඔහුව හඳුනා ගැනීම ගැන සතුටට පත් වූ බව ඔහුගේ හිනාවෙන් මා අවබෝධ කර ගත්තා. ඔහු පැමිණි කාරණාව කාරුණිකව මා ඉටුකර දුන්නා. පෙර දින පැවති ජවය ශක්තිය ඔහුගෙන් නික්මයමින් තිබුණත් පරණ මතකයන් ඔහුව ප්‍රාණවත් කළ බව හගවමින් පරණ හිනාව මා වෙතින් ඉවත්ව යනතෙක් ඔහුගේ මුවග රැදුනා.



අප සංගමයේ 50 වන සංවත්සර උළෙලේ ආරාධිත අමුත්තන් පිළිගැනීම මට භාරවුණා. මට පරණ සාමාජික නාම ලේඛනයක් අරං බැලුවාම ඒ නම් අතර 1926 ඉපදුන කෙනෙක් හිටියා. ඒ කියන්නේ ලබන අවුරුද්දට වයස අවුරුදු 100 ක් වෙන කෙනෙක්. මා ඔහු ගැන සොයා බැලුවා. ඔහු මහ බැංකු සේවයට ඇවිත් තියෙන්නේ 1950 ඔක්තෝම්බර් 1 දා ඒ කියන්නේ මහ බැංකුව පිහිටුවලා මාස 1 කුත් දින 02 කට පස්සේ ඔහු මහ බැංකුවේ සමාරම්භක සේවකයෙක් ඔහුගේ මහ බැංකු හැඳුනුම්පත් අංකය වන්නේ අංක 133 යි. මහ බැංකුවේ ආරම්භක අධිපතිතුමා වන ජෝන් එක්ස්ටර් මහතා යටතේ සිට 1984 වන තෙක් සිටි අධිපතිවරුන් යටතේ සේවය කරලා. වැටුප් ලබා ගෙන තිබෙන ඔහු 1984 සිට මේ දක්වා සිටි සියලුම අධිපතිවරුන් යටතේ විශ්‍රාම වැටුප් ලබාගෙන තියෙනවා. එහෙම සුවිශේෂී කෙනෙක් මහ බැංකු විශ්‍රාමිකයන් අතර තව ඇතියි කියලා මම හිතන්නේ නැ. මහ බැංකුවට අවුරුදු 75 ක් පිරෙන මේ අවස්ථාවේ එම අවුරුදු 75 පුරාවටම මහ බැංකුව හා සබඳතා තැබූ එකම තැනැත්තා ඔහුයි. එතුමා අපේ මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමයේ සාමාජිකයෙක්. එම නිසා එතුමා අප සාමාජික සාමාජිකාවන්ගේ ''ලොකු අයියා'' යි එතුමා අපට ගෞරවයකි.

මා මෙම තොරතුරු අප සංගමයේ සභාපති තුමාට දැන් වූ අතර අප එතුමාව අපේ සංගමයේ 50 වන සංවත්සරයට ''සම්ප්‍රදායික පොල්තෙල් පහන දැල්වීම'' සඳහා ගෙන්වා ගැනීමට උත්සාහ කළත් පැමිණීම අපහසු බව දැන්වූවා. අපේ මිතුරකු එතුමාගේ ගමන් පහසුව

9 පිටුවට...

නොමිලේ සපයා දීමට භාර ගත්තත් එය ඉටුකර ගැනීමට බැරි වුණා. ''පුළුවන් නම් ඇවිල්ලා මාව බලලා යන්න.'' ඔහුගේ ඉල්ලීම වුණා. මා අප සභාපති ජයලාල් මහතා සමඟ කථාකර ඉතා ඉක්මනින් එතුමාව බැලීමට යාමට තීරණය කළා. ඒ අනුව 2025 මාර්තු 19 දින අප ඔහුව බලන්න ගියා. ''මහ බැංකුවේ යාළුවෝ ඔයාව බලන්න ඇවිත්'' කියලා මම කිව්වාම ඔහු අත් දෙක එකතු කර ආචාර කර දෑත් ඔසවා වනමින් කුඩා දරුවකු වගේ සතුටු වුණා. ඒ වේලාවේ ඔහු රැක බලා ගන්නා බාල සොහොයුරියගේ ඇස් වලින් කඳුළු වැටෙනවාත් මා දුටුවා. ඔහු ඉතා අඩුවෙන් කථා කළත් අනිත් අය කියන පරණ විස්තර අහගෙන ඒ කාලය තුල ඉතාමත් සතුටින් හිටියා. ඔහුට කිසිම රෝගාබාධයක් නොමැති බවත් ඔහුගේ නැගණියගේ පුතා අප සමඟ පැවසුවා. අපි ආපසු ඒමට සූදානම් වන විට ඔහු අපි ඔක්කොටමත් කලින් නැගිට අප පසු පස ගමන් ඇවිත් අපට අත වනා සුභ පැතුවා. ඔහුගේ අවු 101 ක් වන වැඩිමල් සොහොයුරිය ද එහි සිටියා. එතුමාව ඥාති පිරිස ඉතා ඕනෑකමින් ආදරයෙන් රැක බලා ගන්නා බව තහවුරු වුණා. එය ලොකුම වාසනාවක්. රෙඩ්ලිච් සේනාරත්න සොහොයුරාණෙනි ඔබට නීරෝගී දීර්ඝායුෂ වේවා යි මහ බැංකු විශ්‍රාමික සංගමයේ ප්‍රාර්ථනාවයි. එදිනම අප පී. වත්තේගම මහතා සහ පියදාස විජේසිංහ මහතාගේ සුවදුක් විචාරීම සඳහා එම නිවෙස් වෙතද ගොස් ඔවුනට ද සුබ පතා පැමිණියෙමු.

**ඥාණා රණතුංග**
**P/1333**

# අනුස්මරණය

හිරු මැදියමේ විත් උණුසුම් ගති          පෑවා
තරු දිලිසුනා දැනගත්තේ නෑ          ඒවා
කරුවල වැටෙන සඳ මිහිරක යොමු          වූවා
ගරු කටයුතුය රන් ජය සැමරුම          පිරුවා

පහලොස් වෙනිදා මැද මාසයේ විදු          පියසේ
අපි එක්වුණා සැමරුම වෙනුවෙන්          රිසිසේ
අධිපති තුමන් පෙර සිටි අප හා          සතොසේ
එක්වි අනගි දෙසුමකි හද තුල          ගැවසේ

තුති මල් මිටක් ගෙන එන්නට සිටියෙ          බලා
කරවන සමිති වැඩ ගැන අපි උදම්          වෙලා
උඩරට නැටුම හා රැඟුමන් එකලු          කලා
විශ්‍රාමික අපේ සමිතිය රකිමු          බලා

සුවයෙන් විවේකය ගෙන ඉන්නා          සැටිය
රසයෙන් පිරුණු රස වැකි බිනුමෙන්          හැඩය
පිරිපුන් වදන් හීසරමෙන් නැගි          විදිය
යහමින් සිතට ගෙන එමු ගත රැදි          එඩිය

අඩ සියවසක සැමරුම ඔබ තෙද          වූවා
කඩතිර නොඇද හැමගෙම සිත් පිර          වූවා
හඬ නැගු පැරණි නයුවන් හැම සිහි          කෙරුවා
හඬ නගමින් කියමු හැමටම සෙත්          වේවා

**විජේරත්න අතුකෝරල**
**P/3391**

# පරසතු මලකට

ලස්සන ලස්සන මල් ලොව පිපුණත්
සුවදැති මල්නම් බොහොම ටිකයි
මලට ආදරේ කෙරුවට කම් නැහැ
ඒත් තහනම් පරසතුනම්

අනේක මල්වල පහස විඳින්නට
බමරුන් සමනලයන් ඒ නම්
ඒ ගැන සිතමින් පරසතු මලකට
පෙම්කිරීම නම් අවදානම්

සිතගිය තැන මාලිගා තනන්නට
ලෝකෙන් අවසර ගන්නට වෙයි
පරසතු මලකට ලංවෙනු කුමටද
තවත් හඳවතක් වැලපේනම්

නිමල් චාර්ල්ස් වික්‍රමසිංහ
**P/1097**



# CENTRAL BANK OF SRI LANKA PENSIONER'S ASSOCIATION

# EXCO : MEMBERS ADDRESS AND CONTACT DETAILS 2025-2026

| NAME | ADDRESS | CONTACT NO |
|---|---|---|
| MR. S.K.J.U. JAYAWARDENA | 02, THISSA MW,QURRY RD, DEHIWALA | 077 741 2289 |
| MR. D.P.CHANDARASIRI | 626/14, GOVINNA RD, SAMA PLACE , ATHURUGIRIYA | 071 44 33 198 / 0112078604 |
| MRS. SUMITHA WICKRAMASINGHE | 1043/15, POTHUARAWA RD, MALABE | 071 812 4011 / 071 453 8468 |
| MR.A.THANTHIRGE | 104/8, STANLEY THILAKARATHNA MAWATHA, NUGEGODA | 071 8664238 / 0112811049 |
| MR.C.HETTIHEWA | 487/D, VIJAYABA MW, WALIVITA ROAD, KADUWELA | 077 2900900 |
| MRS. L. MOHANA SUNDARAM | 25, 3/2, ARTHUSHA LANE, WELLAWATTA, COLOMBO 06 | 077 837 85 06 |
| MISS. C. EDIRIMANNA | 22/39, OLD KASBAWA RD, GANGODAVILA , NUGEGODA | 077 785 4939 |
| MRS. G. GOONASEKERA | 36/A, LADY EVALIN DE SOYSA MW, IDAMA , MORATUWA | 077 9830686 |
| MRS. P,. WIJARATHNA | 1/1/B, HOLLY CROSS AVENUE , MORATUWA | 071 4433222 |
| MR. H. FERDINANDO | 28/35/7, BAUDDHALOKA MW, SWARAPOLA, PILIYANDALA | 071 8579886 |
| MRS. GNANA RANATHUNGA | B-8. 2/4, JAYANTHA WEERASEKARA MW, COLOMBO 10 | 077 4035536 011 2478580 |
| MR. K.S. THILAKARATHNA | 232/2, ARACHCHI KANDA, HIKKADUWA | 071 374 8549 / 091 2277123 |
| MR. J. KARIYAWASAM | 202, WANDURAMULLA WATTA, WANDURAMULLA, PANADURA | 076 4443570 / 0382236643 |
| MR. R.D. ATHUKORALA | 286/8, EKSATH MW, SIYAMBALAPE NORTH, SIYAMBALPE | 078 2487823 |
| MR.K. JEGANATHAN | 4/2, OFF FAIRLINE RD, DEHIWALA | 071 4287569 / 011 272 76 42 |

..............................................

HON.SECRETARY

2025-05-09

ඩී. පී චන්ද්‍රසිරි
ලේකම්
ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය
626/14, ගෝවින්න පාර, සාම පෙදෙස
අතුරුගිරිය.

## සටහන 01 හා සබැඳේ

2025.04.26 දින රාජගිරියේදී පවත්වන ලද වාර්ෂික සභා රැස්වීමේදී සාමාජිකයෙකු විසින් විමසන ලද ප්‍රශ්නයට අදාළව මෙම සවිස්තරාත්මක පිළිතුර පලකරන බව කරුණාවෙන් සලකන්න.

විධායක කමිටුව

සටහන 01

2024 ජුනි මස 08 වන දින එක්දින වාරිකාව හා සුහද හමුව කුකුලේගග ලයා ලෙෂර් හෝ ටල් පරිශ්‍රයේදී පවත්වන ලදි. ඒ සඳහා වූ වියදම් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| සහභාගි වූ සංඛ්‍යාව 103 × 6500 | | | = රු. 669,500 |
| හෝටල් ගාස්තු | - | රු. 378,560 | |
| ප්‍රවාහන ගාස්තු | - | රු. 175,580 | |
| උදේ ආහාරය | - | රු. 34,350 | |
| හයිවේ ටිකට්ස්, බයිට්ස්, ගේම්ස් | - | රු .6760 | |
| | | රු. 595,250 | |
| වියදම් | | | - රු.595,250 |
| අතිරික්තය | | | - රු. 74,250 |

සටහන 02

2024 නොවැම්බර් මස 08 වන දින තුන්දින වාරිකාව හා සුහද හමුව පොළොන්නරුව ගිරිතලේ හෝටෙල් පරිශ්‍රයේදී පවත්වන ලදි. ඒ සඳහා වූ වියදම් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| සහභාගි වූ සංඛ්‍යාව 83 × 23000 | | | - රු. 1,909,000 |
| හෝටල් ගාස්තු | - | රු. 1,678,450 | |
| දින 3 සඳහා දවල් ආහාරය | - | රු. 147,900 | |
| අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා (Cargils Bill) | - | රු 64,210 | |
| හයිවේ ටිකට්ස්, Parking, Museum Tickets, Guide | | රු. 7,650 | |
| රියදුරුගේ උදේ ආහාරය | | රු. 1,125 | |
| වතුර බෝතල්, Cake, Coca cola | | රු. 33,689 | |
| | | රු. 1,933,024 | |
| වියදම් | | | - රු.1,933,024 |
| ලැබීම් | | | - රු.1,909,000 |
| තුන් දින වාරිකාවේ හිඟ මුදල | | | - රු. 24,024 |

තුන්දින වාරිකාවේ බස්රථ 02 සඳහා මුදල් රු.490,000/- ශ්‍රී ලංකා මහ බැංකුව මගින් Travel Point (Pvt) Ltd වෙත ගෙවන ලදී.

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය

## Central Bank Pensioners' Association

නො 626/14, ගෝවින්න පාර, සාම පෙදෙස, අතුරුගිරිය.

ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා  
අධිපති,  
ශ්‍රී ලංකා මහ බැංකුව,  
අංක 30,  
ජනාධිපති මාවත,  
කොළඹ 01.

2025.03.03

මහත්මයාණෙනි,

**<u>2024 - විශ්‍රාම වැටුප් සංශෝධනය</u>**

පසුගිය 17 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මුදල් අමාත්‍ය අනුර කුමාර දිසානායක මහතා විසින් ඉදිරිපත්. කරන ලද අයවැය යෝජනාව අනුව රජයේ හා රාජ්‍ය සංස්ථාවල විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වල ඇති සියලුම විෂමතා ඉවත්වන පරිදි 2020 ජනවාරි මසට යාවත්කාලීන කිරීමට යෝජනා කරන ලදී.

අපගේ 2024 ට අදාල විශ්‍රාම වැටුප් සංශෝධනය මෙතෙක් නොවිසඳී ඇති අතර, මීන් පෙර ඉල්ලූ පරිදි මෙම සංශෝධනය ලෙස අපගේ විශ්‍රාම වැටුප ද 2018 ජනවාරි මසට යාවත්කාලීන කර දෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

ස්තුතියි

මෙයට,

විශ්වාසී

.........................................  
සභාපති

.........................................  
ලේකම්

එස් කේ ජේ සූ ජයවර්ධන  
සභාපති  
0777 112289

ඩී.පී. චන්ද්‍රසිරි  
ලේකම්  
071 4433 198  
011 2078 604

චන්ද්‍රකාන්ති වීදිරිමාන්න  
භාණ්ඩාගාරික  
077 7854 939

13 පිටුවට...

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය

## Central Bank Pensioners' Association

නො. 626/14, ගෝවින්න පාර, සාම පෙදෙස, අතුරුගිරිය.


2025/04/24

ආචාර්ය නන්දලාල් වීරසිංහ මැතිතුමා,

අධිපති ,

ශ්‍රී ලංකා මහ බැංකුව ,

අංක. 30,

ජනාධිපතිමාවත ,

කොළඹ 01,

මහත්මයාණෙනි,

**<u>2024 විශ්‍රාම වැටුප් සංශෝධනය පිළිබඳවයි.</u>**

2024 විශ්‍රාම වැටුප් සංශෝධනය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලකමණ්ඩලයේ ලේකම්තුමිය විසින් අප සංගමය වෙත 07/04/2025 දාතමින් එවන ලදලිපියට 09/04/2025 දාතමින් අධිපති තුමා ඇතුලු පාලක මණ්ඩලයේ සාමාජිකයින්වෙත යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් ඔබතුමා හා පාලක මණ්ඩලය සමඟ සාකච්ජාවක් ලබා ගැනීම සඳහා මෙම ලිපිය යොමු කරන අතර, මේ පිළිබඳව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කර , අප සංගමයේ සාමාජිකයින් කිහිපදෙනෙකු සඳහා නොපමාව සාකච්ජාවක් ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.

ස්තුතියි.

මෙයට,

...........................................

ලේකම්

පිටපත : ලේකම් පාලක මණ්ඩලය ශ්‍රී ලංකා මහ බැංකුව


එස් කේ ජේ යූ ජයවර්ධන
සභාපති
0777 412289

ඩී.පී. චන්ද්‍රසිරි
ලේකම්
071 4433 198
011 2078 604

චන්ද්‍රකාන්ති විඳිරිමාන්න
භාණ්ඩාගාරික
077 7854 939

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය

නො.626/14, ගෝවිත්ත පාර, සාම පෙදෙස, අතුරුගිරිය.

2025-05-09

ආචාර්ය නන්දලාල් වීරසිංහ මැතිතුමා
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව
ජනාධිපති මාවත
කොළඹ 01

අධිපතිතුමනි

**<u>2025 – 2026 වසර සඳහා මහ සභා රැස්වීමේදි තේරී පත්වූ නව විධායක කමිටුව</u>**

අප සංගමයේ වාර්ෂික මහ සභා රැස්වීම 2025.04.26 දින ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජගිරියේ විදුපියසේදී පැවැත්විය. විදුපියසේ ප්‍රධාන ශාලාව හා අනෙකුත් සියළුම පහසුකම් නොමිලේ සංගමය සඳහා ලබාදීම පිළිබඳව අප සංගමයේ ගෞරවය හා ස්තූතිය ඔබතුමා වෙත පිරිනමමු. ඔබතුමාගේ දැනගැනීම සඳහා අභිනවයෙන් තේරී පත්වූ විධායක කමිටුවේ නාමලේඛනය මෙහි පහත සඳහන් කරමු.

| | | |
|---|---|---|
| ගරු සභාපති | - | එස්. කේ. ජේ. යූ. ජයවර්ධන මහතා |
| ගරු ලේකම් | - | ඩී. පී. චන්ද්‍රසිරි මහතා |
| ගරු භාණ්ඩාගාරික | - | සුමිතා වික්‍රමසිංහ මහත්මිය |
| ගරු උප සභාපති | - | ආරියදාස තන්ත්‍රිගේ මහතා |
| ගරු උප ලේකම්වරු | - | චන්ද්‍රදාස හෙට්ටිහේවා මහතා |
| | | ලීලා මෝහනසුන්දරම් මහත්මිය |
| ගරු උප භාණ්ඩාගාරිකවරු | - | චන්ද්‍රකාන්ති එදිරිමාන්න මෙනවිය |
| | | ගීතමාලා ගුණසේකර මහත්මිය |
| ගරු සමාජ්ය ලේකම් | - | පද්මිනි විජේරත්න මහත්මිය |
| ගරු විධායක කමිටුව | - | ඥානා රණතුංග මහත්මිය |
| | | ජගත් කාරියවසම් මහතා |
| | | කේ. එස්. තිලකරත්න මහතා |
| | | ආර්. ඩී. අතුකෝරළ මහතා |
| | | හේමසිරි ෆර්ඩිනැන්ඩු මහතා |
| ගරු ගිණුම් පරීක්ෂක | - | කේ. ජෙගනාදන් මහතා |

..................................
ගරු සභාපති

..................................
ගරු ලේකම්

පිටපත් 01 - අධ්‍යක්ෂ, මානව සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තුව
02 - ලේකම්, ලේකම් දෙපාර්තමේන්තුව


එස්.කේ.ජේ.යූ. ජයවර්ධන
සභාපති
0777 412289

ඩී.පී. චන්ද්‍රසිරි
ලේකම්
071 4433 198
011 2078 604

චන්ද්‍රකාන්ති එදිරිමාන්න
භාණ්ඩාගාරික
077 7854 939


15 පිටුවට...

ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය
Central Bank Pensioners' Association
නො. 626/14, හෝමින්න පාර, සාම පෙදෙස, අතුරුගිරිය.

2025-05-09

ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා,
අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව,
අංක 30 ,
ජනාධිපති මාවත,
කොළඹ 01.

මහත්මයාණෙනි,

**<u>2025 – 04 –26 වන දින පැවති අප සංගමයේ වාර්ෂික මහ සභා රැස්වීමේදී සම්මත කර ගන්නා ලද යෝජනා පිළිබඳවයි.</u>**

1. ජනාධිපතිතුමන් විසින් 2025 අයවැය යෝජනා අනුව රජයේ හා මණ්ඩල වල විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප සියලුම විෂමතා ඉවත් වන සේ 2020 ට යාවත්කාලීන කිරීමට යෝජනා කර ඇත. මහ බැංකු විශ්‍රාමිකයන්ගේ මෙතෙක් ඉටු වී නොමැති 2024 විශ්‍රාම වැටුප් සංශෝධනය ලෙස අපගේ විෂමතා ද ඉවත් වන පරිදි 2018 ට යාවත්කාලීන කර දෙන මෙන් මහ බැංකු පාලනාධිකාරයෙන් ඉල්ලා සිටිමු.
2. කොරෝනා සමයෙහි විශ්‍රාමිකයින් මහ බැංකුව තුලට ඇතුළු වීම වැලැක්වීමට පැනවූ තහංචිය මෙතෙක් ඉවත් නොකිරීම පිළිබඳව මෙම මහා සභාව දැඩි අප්‍රසාදය පලකරන අතර විශ්‍රාමිකයින්ට මහ බැංකුවට ඇතුළුවීම වලක්වන තහංචිය ඉවත් කරන ලෙස මෙම මහා සභාව යෝජනා කර සිටී.
3. මහ බැංකු වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ ඇති cat C,D සහ E කාණ්ඩය සඳහා මෙතෙක් හිමිකම් ලබා ගැනීම අතපසු වී සිටින විශ්‍රාමිකයින් වෙනුවෙන් , එම ක්‍රමය ඇරඹූ දින සිට මේ දක්වා ගෙවිය යුතු දායක මුදල හා ඊට අදාළ පොලිය ගෙවීමෙන් අනතුරුව නැවත දායකත්වය ලබාදීමට අවස්ථාවක් සලසා දෙන ලෙස මහ බැංකු පාලනාධිකාරයෙන් ඉල්ලා සිටිමු.
4. වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමයේ 3 කාණ්ඩය බාහිර ප්‍රතිකාර යටතේ මහ බැංකු සේවකයන්ට හා විශාමිකයන්ට පමණක් බාහිර ප්‍රතිකාර සහ ( ඉ) හදවත් රෝග සඳහා බාහිර ප්‍රතිකාර සඳහා වන හිමිකම් පැමේ අවස්ථාව සියලුදෙනාගේම කලත්‍රයන්ට ද ලබාදෙන මෙන් මෙම සභාව පාලනාධිකාරියෙන් ඉල්ලා සිටිමු.

[illegible] ජයවර්ධන
සභාපති
0777 112289

ඩී.පී. චන්ද්‍රසිරි
ලේකම්
071 4433 198
011 2078 604

චන්ද්‍රකාන්ති එදිරිමාන්න
භාණ්ඩාගාරික
077 7854 939

5. VRS ක්‍රමය යටතේ විශ්‍රාම වැටුප ගණනය කිරීමට අදාළ වන සේවා කාලය ගණන් බැලීමේ දී සිදුවී ඇති දෝෂය පසුව විශ්‍රාමිකයන් 05 දෙනෙකුට පමණක් නිවැරදි කර දී ඇත. එම නිවැරදි කිරීම අදාළ වන තවත් විශ්‍රාමිකයින් 05 දෙනෙකුට පමණක් එම විශ්‍රාම වැටුප නිවැරදි කිරීම මෙතෙක් ඉටු නොකිරීම පිළිබඳව මෙම මහා සභාව අප්‍රසාදය පලකරන අතර මෙම විශ්‍රාමිකයින් 05 දෙනාටද විශ්‍රාම වැටුප නිවැරදි ලෙස සකස් කර වහාම ක්‍රියාත්මක කරන ලෙස පාලනාධිකාරයෙන් ඉල්ලා සිටිමු.

6. 2025 අගෝස්තු 28 වන දින මහ බැංකුව තම 75 වන සංවත්සරය සමරනු ලබයි.එම 75 වසර තුළ වැඩිම කාලයක් කැප කළ සියළුම විශ්‍රාමිකයන්ට එම සේවය ඇගයීමක් ලෙස මාසික විශ්‍රාම වැටුපක් ලබාදෙන ලෙස පාලනාධිකාරියෙන් ඉල්ලා සිටිමු.

7. ශ්‍රී ලංකා අවමංගල්‍ය සහනාධාර අරමුදල (DRF) වැඩි සාමාජික පිරිසක් නියෝජනය කරන අතර විශ්‍රාමිකයින් 700 ක් පමණ දැඩි අපහසුතාවකට පත්ව ඇති තත්වය තුළ මේ වන විට මියගිය 71 දෙනෙකුගේ පමණ සහනාධාර අරමුදල් යැපෙන්නන් හට ලබාගැනීමට නොහැකිව පොරොත්තු ලේඛණයේ රැඳී සිටී මට සිදුව ඇත. මෙම ප්‍රශ්නය විසඳා අරමුදල යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙසද එම අරමුදලේ මුදල් පෞද්ගලික මූල්‍ය ආයතනයක ආයෝජනය කිරීම සඳහා එවකට අනුමැතිය ලබාදුන් අයගෙන් අයකර හෝ මෙම අරමුදල යාවත්කාලීන කරන ලෙස මහා සභාව යෝජනා කරන්නීය.

8. මහ බැංකු සේවයේ යෙදී සිටි කාලයේ දී හා 2023 වර්ෂයේ දී වැඩි දියුණු කළ වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමයට සම්බන්ධ වී මාසිකව එම අරමුදල ගෙවීම් කරන, බෝම්බ ප්‍රහාරයට පවා ලක් වී දරුණු ලෙස ආබාධිතව තවත් කෙනෙකුගේ පිළිසරණ ලබාගෙන දිවි ගැටහසන, සුළු විශ්‍රාම වැටුපක් ලබන අයට රෝහල් බිල්පත් තමන් විසින් ගෙවා පසුව හිමිකම් පෑමට සිදුවීමෙන් මහත් අපහසුතාවයන්ට පත්වීමට සිදු වී ඇත. ඒ නිසාම සමහරු අවශ්‍යම ප්‍රතිකාර ලබා ගැනීමට පවා රෝහල්ගත වීමට පසුබට වෙති. ඒ රෝහල් බිල්පතක් තමා විසින් ගෙවීමට නම් විශාල පාඩුවක් දරාගෙන සිය නිශ්වල හෝ චංචල දේපලක් විකිණීමට හෝ ගිහි පොලීකරුවන්ට හසුවීමට සිදුවීමෙනි.


[illegible]
සභාපති
0777 112289

ඩී.පී. චන්ද්‍රසිරි
ලේකම්
071 4433 198
011 2078 604

චන්ද්‍රකාන්ති එදිරිමාන්න
භාණ්ඩාගාරික
077 7854 939


17 පිටුවට...

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය

## Central Bank Pensioners' Association

නො. 026/14, ගෝවින්න පාර, සාම පෙදෙස, අතුරුගිරිය.


මහ බැංකු මුල් කාලයේ දී එවැනි බිල්පතක් ඉදිරිපත් කළ පසු එදිනට ගෙවීම් කිරීමට චෙක්පතක් ලබා දී රෝහලෙන් පිටවීමට අවස්ථාව ලබා දුන් කාලයක් තිබුණි. රටේ සමහර රක්ෂණ සමාගම් පවා රෝහල් බිල්පත් සඳහා ගෙවීම් චෙක්පත් , රෝහල් වෙත ගෙනවුත් භාර දෙනු අප දැක ඇත. ක්ෂණිකව තොරතුරු ලබාගත හැකි තාක්ෂණය දියුණු මෙවැනි යුගයක විශ්‍රාමිකයින් අපහසුතාවයට පත් නොකොට, විශාල මුදලක් ගෙවීමට සිදුවන බිල්පත් ඉදිරිපත් වූ විටෙක, මීට පෙර කළ එදිනම ගෙවීම් කොට රෝහලෙන් පිටවීමට ඉඩ සලසාදෙන දෙන ලෙස ඉල්ලා මහ බැංකු පාලකයන් සමඟ සාකච්ජා කරන ලෙසට මෙයින් යෝජනා කර සිටිමු.

සම්මත කරන ලද මෙම යෝජනා පිළිබඳව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරනු ඇතැයි,බලාපොරොත්තු වෙමු.

ස්තූතියි
මෙයට

සභාපති

ලේකම්

පිටපත් 1. අධ්‍යක්ෂ මානව සම්පත් දෙපාර්තමේන්තුව

2. අධ්‍ය ක්ෂ කාර්ය මණ්ඩල සේවා කළමනාකරන දෙපාර්තමේන්තුව


[illegible] ජයවර්ධන
සභාපති
0777 112289

ඩී.පී. චන්ද්‍රසිරි
ලේකම්
071 4433 198
011 2078 604

චන්ද්‍රකාන්ති විදිරිමාන්න
භාණ්ඩාගාරික
077 7854 939

**මෙහි පහත නම් සඳහන් අපගේ සාමාජික සාමාජිකාවන් සංගමය විසින් සංවිධානය කරනු ලැබූ පොත් බෙදාදීමේ උත්සවයට හා ස්වර්ණ ජයන්ති උත්සවයේ සමරු කලාපයේ සුභාශිංසන දැන්වීම් පලකිරීම වෙනුවෙන් ඔවුන්ගේ මූල්‍ය දායකත්වය ලබාදුන් බව කෘතඥතාවයෙන් සිහිපත් කරමු.**

**විධායක කමිටුව**

**රාජගිරිය රෝමානු කතෝලික දෙමළ පාසලේ පොත් බෙදාදීම වෙනුවෙන් ආධාර කළ සාමාජික සාමාජිකාවන්ගේ නම් පහත සඳහන් පරිදි වේ.**

| | | |
|---|---|---|
| 1. | L.L. ඩග්ලස් සිල්වා මහතා | රු. 90,000.00 |
| 2. | වසන්ත උතුමන්ගේ මහතා | රු. 20,000.00 |
| 3. | K.M. ජයසේන මහතා | රු. 15,000.00 |
| 4. | N.L.P. දයානන්ද මහත්මිය | රු. 10,000.00 |
| 5. | රූපා විමලසිරි මහත්මිය | රු. 10,000.00 |
| 6. | R.A.D. තිලකරත්න මයා | රු. 10,000.00 |
| 7. | දයා ජයතුංග මිය | රු. 5,000.00 |
| 8. | ශ්‍රදානා රණතුංග මිය | රු. 5,000.00 |
| 9. | අමරා ප්‍රනාන්දු මිය | රු. 5,000.00 |
| 10. | විශාඛා රාජකරුණා මිය | රු. 5,000.00 |
| 11. | රූපා රණසිංහ මිය | රු. 5,000.00 |
| 12. | සාගරිකා අමරසිංහ මහත්මිය | රු. 4,000.00 |
| 13. | A.W.U. ටිකිරිබණ්ඩා මහතා | රු. 3,000.00 |
| 14. | M.A. ප්‍රේමසිරි මහත්මිය | රු. 2,000.00 |
| 15. | කුසුම් රණතුංග මහත්මිය | රු. 2,000.00 |
| 16. | E.L.K. ප්‍රනාන්දු මහතා | රු. 2,000.00 |
| 17. | E.A. ප්‍රනාන්දු මහතා | රු. 2,000.00 |
| 18. | පද්මිණී විජේරත්න මිය | රු. 2,000.00 |
| 19. | ජයලාල් ජයවර්ධන මහතා | රු. 2,000.00 |
| 20. | D.P. චන්ද්‍රසිරි මහතා | රු. 2,000.00 |
| 21. | ජගත් කාරියවසම් මහතා | රු. 2,000.00 |

**ස්වර්ණ ජයන්ති සමරු කලාපය වෙනුවෙන් සුභාශිංසන දැන්වීම් ලබාදීම.**

| | | |
|---|---|---|
| 1. | L.L. ඩග්ලස් සිල්වා මහතා | රු. 20,000.00 |
| 2. | වසන්ත උතුමන්ගේ මහතා | රු. 15,000.00 |
| 3. | D.D. කොළඹගේ මහතා | රු. 15,000.00 |
| 4. | කොමර්ෂල් බැංකු දැන්වීම වෙනුවෙන් (D. ධීරසිංහ මහතාගේ කාරුණික මැදිහත්වීම) | රු. 15,000.00 |
| 5. | D. ජයවර්ධන මහතා | රු. 7,500.00 |
| 6. | ශ්‍රදානා රණතුංග මහත්මිය හා පද්මිණී විජේරත්න මිය | රු. 7,500.00 |
| 7. | බර්නි ප්‍රනාන්දු මහත්මිය | රු. 5,000.00 |

# විධායක හිඟන්නා

රතු පාට දැල්වුනා වාහනේ නැවතුනා
ටයි කෝට් ඇඳ ගත්තු කෙනෙක් මට ලං වුනා
ඉදිරි දොර වීදුරුව අරින්නම සිදුවුනා
චතුර ඉංගිරිසියෙන් ඔහුගෙ තොල්
සෙලවුනා

මමයි එම්,.ඩී. වුනේ ......... කොම්පැණියෙ
දැන් වහපු
මේ මොඩිල් එක තමයි ජීප් එක මම පැදපු
රස්සාව නැති වුනා මෙතෙක් කල් මම කරපු
විකුණ්නා සේසතම දුක දිනා රැස් කරපු

නොරටකට ගියේ යලි ජීවිතේ ජය ගන්න
එහේ මෙහේ වගේ බෑ ජොබ් එකක්
අරගන්න
ෂෙඩ් එකක පෙට්‍රලුත් ගැහුවෙ ජීවත් වෙන්න
බැරිම තැන සිදුවුනේ යලිත් මව් රට එන්න

සොයාගෙන ගියත් යලි විධායක තනතුරක්
බංකොලොත් දේශයක එයත් එක හීනයක්
නැවතිලා මහ ගෙදර සොයන කොට
තාලයක්
විධායක හිඟමනට ඇති වුනා ලෝලයක්

කොල,කාසි ඔබේ ලඟ නොමැති බව
දන්නවා
කාඩ් පත් වලින් හැම ගෙවන බව පේනවා
තව ටිකෙන් රතුපාට නිවී කොල වැටෙනවා
කාඩ් එක දෙන්න ලඟ මෙෂින් එක
තියෙනවා

දුක හිතුනි අසා මේ හිඟන්නගෙ කතාව
කාඩ් පත යොමු කලා හෙලා මද හිනාව
රිසිට්පත දී දහක් අය කරපු මනාව
විධායක හිඟන්නට දුනිමි මම සමාව

(ජගත් ද සොයිසා )

# රස කතා

1 මිතුරා : පුලුවන් නම් කියපං චීන මහා
ප්‍රාකාරය ලෝක පුදුමයක්
වෙන්නෙ ඇයි කියලා?

2 මිතුරා : දන්නේ නෑ. සිරාවටම
ඇයි බං ඒ.

1 මිතුරා : වැඩිම කාලයක් පැවතුන එකම
චයිනීස් දේ නිසා.

2 මිතුරා : උඹ නම් මාරයි අෑ.

---



| | |
|---|---|
| පලංචියේ ලී ඉරුවේ අපි | එකට |
| මල් පැන් පොදක් රහ බැලුවේ අපි | දෙකට |
| පොලීසියෙන් පැන්නේ ඇයි | තුනට |

---

1 වැන්නා : සැබෑ ආදරය හඳුනාගත
හැක්කේ නීති දමා
සිරකරගැනීමෙන් නොව හැකි
තරම් නිදහස දීමෙනි.

2 වැන්නා : අනේ නිකං පලයං මහත්තයෝ
එහෙම කියලා ලොකු එකීට
නිදහස දුන්න පාර තවම ඒකි
ආගිය අතක් නෑ.

**K.L.J. ඩයස්**

---

## කාරුණික දැන්වීමයි

සාමාජික සාමාජිකාවන් රැසක් ඔවුන් අපවෙත ලබාදී ඇති ලිපිනයේ ඔවුන් නොමැති බව දන්වා සංගමය මගින් යවන ලිපි හා සැඟෑව සඟරාව නැවත අප වෙත ලැබී ඇත. ඔවුන්ගේ ලිපිනය වෙනස්වීම් ලේකම් දෙපාර්තමේන්තු විශ්‍රාම වැටුප් අංශයට දන්වනවා සේම අප වෙත ද දන්වා දැනුවත් කිරිමට කාරුණික වන්න.

**සංස්කාරක**

- සැඳෑව සඟරාවේ පළකිරීම සඳහා එවන ලිපි සංගමයේ ලේකම් වෙත යොමු කරන්න.
- ඔබගේ ලිපි හැකිතරම් සංක්ෂිප්තව සකස් කරන්න.
- සැඳෑව මුද්‍රණය කරගැනීම සඳහා මහ බැංකු මුද්‍රණාලයෙන් සැපයුණු පහසුකම් දැන් නොලැබෙන බැවින් සැඳෑවේ පිටු ගණන සීමා කිරීමට සිදුව ඇති බවද කරුණාවෙන් සලකන්න.

**සංස්කාරක**

වෙබ් අඩවිය : www.sendewa.org

අංක : DOP/NEWS/34/2025 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදි.

**ගරු ලේකම්,**
**ඩී.පී. චන්ද්‍රසිරි මහතා**
**ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය**
**626/14, ගෝවින්න පාර,**
**සාම පෙදෙස, අතුරුගිරිය.**

Neo Graphics - 44, Station Rd, Gangodawila, Nugegoda